F - 08

# මහවැලි සංවර්ධන ප්‍රදේශයේ ඉඩම් ජනාවාසකරණයෙහි වර්තමාන ප්‍රතිඵල — 'එච්' ප්‍රදේශයේ තෝරාගත් ගම්මාන කිහිපයක් ඇසුරෙනි

ජී. සෙනරත්
(භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්ව විද්‍යාලයීය විද්‍යායතනය, මාතර)

මෙම අධ්‍යයනය යටතේ මහවැලි සංවර්ධන ප්‍රදේශයෙහි තෝරාගත් ගම්මාන කිහිපයක් ඇසුරෙන්, මෙම සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කල අවස්ථාවෙහි තිබුණු තත්ත්වය සහ වර්තමාන තත්ත්වය පිළිබඳව අගැයීමක් කරනු ලැබේ. සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කල අවස්ථාවෙහි තිබූ පසුබිම 1975/1976 වර්ෂ ඇසුරෙන් කරන ලද අධ්‍යයනයකින් පැහැදිලි කරන අතර 1981 කරන ලද අධ්‍යයනයක් ඇසුරෙන් වර්තමාන තත්ත්වය පිළිබඳව සලකා බලා ඇත.

ඉඩම් ජනාවාසකරණය සිදුකල මුල් අවස්ථාවෙහි තිබූ තත්ත්වය සලකා බැලීමේදී වාරිමාර්ග කටයුතු, ඉඩම් පරිහරන ක්‍රමය, භෝග වගාවන්, ප්‍රජා සංවර්ධන කටයුතු ආදියෙහි මූලික ක්‍රියාත්මක වීම් පිළිබඳව සලකා බලා ඇත. එම තත්ත්වය සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මකවී වසර 4ක පමණ කාලයක් පසුව කොතෙක් දුරට වෙනස් වී තිබේද යන්න 1981 කරන ලද අධ්‍යයනය ඇසුරෙන් පැහැදිලි කර ඇත. වාරිමාර්ග කටයුතු, ඉඩම් පරිහරන රටාව, භෝග වගාවන්, සහ ප්‍රජා සංවර්ධන කටයුතු වල ඇතිවූ වෙනස්කම් සහ ඒවායේ ප්‍රතිඵල මේ යටතේ ඉදිරිපත් කෙරේ.